# ඉංගිරිසි නීතියට යටත් නායක පදවි

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය මේ වන විට භික්ෂූන් වහන්සේ අධ්‍යාපනයේ නායකත්වයෙන් මුළුමනින් ම ඉවත්කිරීමෙන් තම අවශ්‍යතා විශාල වශයෙන් ඉටුකර ගෙන ඇත. ඒ ඉටුකරන ලද්දේ මුළුමනින් ම බටහිරයන් විසින් නොවන බව අපි පැහැදිලි කෙළෙමු. යුරෝපීයයන් ආරම්භකළ ක්‍රියාවලිය අවසන් කරනු ලැබුයේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආධිපත්‍යයට යටවී එහි අවශ්‍යතා වෙනුවෙන් ක්‍රියාකරන සිංහලයන්, බොහෝ විට සිංහල බෞද්ධයන් විසිනි.

එලෙස සිදුවන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දේශපාලන ආධිපත්‍යය නිසාම පමණක් නො වේ. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සංස්කෘතික ආධිපත්‍යය මෙහි දී විශාල කාර්යභාරයක් ඉටු කරයි. මෙරට සිටින අධ්‍යාපන විශේෂඥයන් යැයි කියනු ලබන සියළු දෙනාම පාහේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සංස්කෘතික ආධිපත්‍යයෙහි දාසයෝ වෙති. ඔවුන්ගෙන් සමහරකු ඇතැම් විට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දේශපාලන ආධිපත්‍යයට යට නොවූවන් විය හැකි ය. ඔවන්ගෙන් ඉතා පැරණි කිහිප දෙනකු එකී දේශපාලන ආධිපත්‍යයට එරෙහිව සටන් වැදුණු අය විය හැකි ය. එහෙත් ඔවුනට බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යයෙහි සංස්කෘතික සංරචකයෙන් ගැලවීමක් නැත.

අප නොහෝ අවස්ථාවල සඳහන් කර ඇති ආකාරයට අද අප පාලනය කෙරෙන්නේ ප්‍රධාන වශයෙන් ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සංස්කෘතික සංරචකය මගිනි. පාසල්, විශ්වවිද්‍යාල හා ජනමාධ්‍ය මේ සංස්කෘතික ආධිපත්‍යය මෙරට ක්‍රියාත්මක කිරීමේ දී විශේෂයෙන් ම යොදා ගැනෙන ආයතන වෙයි. එහෙත් මෙයින් කියැවෙන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි දේශපාලන හා ආර්ථික සංරචක අද ක්‍රියාත්මක නොවන බව නො වෙයි. ලෝකයේ සමස්ත ආර්ථිකය ම අද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ආර්ථික අවශ්‍යතා අනුව මෙහෙයවනු ලැබෙයි. බටහිරයෝ තමන්ට අවශ්‍ය යැයි හැඟී ගිය විට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි දේශපාලන සංරචකය කිසිම පැකිළීමකින් තොරව යොදා ගනිති. මෙරට ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයෙහි දී ආර්ථික හා දේශපාලන සංරචක ක්‍රියාත්මක වන ආකාරය මෙරට සිටින ඇතැම් තානාපතිවරුන්ගේ හා මහකොමසාරිස්වරුන්ගේ ක්‍රියා මාර්ගයෙන් පැහැදිලි වෙයි.

අධ්‍යාපනයේ නායකත්වයෙන් භික්ෂූන් වහන්සේ පළවා හැරීමට සමගාමීව භික්ෂුවහන්සේට සමාජයේ තිබූ වැදගත්කම නැතිකිරීමට ද බ්‍රිතාන්‍යයෝ කටයුතු කළහ. බ්‍රිතාන්‍යයෝ උඩරට ගිවිසුම නමින් හැඳින්වෙන 1815 දී අත්සන් කරන ලද සිංහල බ්‍රිතාන්‍ය ගිවිසුමෙන් බුදුදහම රැකීමට පොරොන්දු වූ නමුත් 1840 පමණ වන විට දන්ත ධාතූන් වහන්සේගේ ද භාරකාරත්වයෙන් මිදී බුදු දහම සම්බන්ධ රාජකාරිවලින් ඉවත්වීමට සමත්වූහ. එපමණක් නොව ඔවුහු තම නීති රීති අනුව භික්ෂූන් වහන්සේ සම්බන්ධයෙන් කටයුතුකිරීමට ද පටන්ගත්හ. අද ද භික්ෂූන් වහන්සේ අතර පවත්නා නායක පදවි, විහාරාධිපති පදවි බ්‍රිතාන්‍යයන්ගේ නිර්මාණ වෙයි.

පැරණි සිංහලයන් විහාරාරාම පූජා කෙළේ එකල මෙන් ම අනාගතයේ ද වැඩවසන සතර දිශාවෙන් වැඩම කළ භික්ෂු සංඝයා වහන්සේ වෙනුවෙනි. ඉතිහාසයේ කිහිප තැනක එයට පටහැණිව ගිය අවස්ථා වෙතත් මූලික වශයෙන් ගත්කල විහාරයට හිමිකම් කී භික්ෂූන් වහන්සේ නමක් නොසිටි සේක. එහෙත් බ්‍රිතාන්‍යයෝ විහාරාධිපති පදවි ඇතිකලා පමණක් නොව විහාරාධිපති භික්ෂූන් වහන්සේගේ අපවත්වීමෙන් පසුව විහාරාධිපති පදවිය හිමිවිය යුත්තේ කාහට ද යන්න පිළිබඳව ද නීති සම්පාදනය කළහ. එහි දී ඔවුන් යොදාගත්තේ එංගලන්තයේ පැවති ප්‍රථමජන්මාධිකාරය (primogeniture) නම් නීතිය ය.

එංගලන්තය බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යටතෙහි අනෙක් යුරෝපීය රටවලට වඩා ඉක්මණින් දියුණුවීමට මේ නීතිය ඉවහල් විය. එය ඉඩම් අයිතිය පිළිබඳ නීතියක් විය. ඉඩම් හිමියා මියගිය පසු ඉඩම හිමි වූයේ, එනම් ඉඩමෙහි අධිකාරය හිමිවූයේ ඉඩම් හිමියාගේ වැඩිමහල් පුත්‍රයාට ය. එනම් ප්‍රථම ජන්ම ලාභියාට ය. ඒ නීතිය ප්‍රථමජන්මාධිකාරය ලෙස හඳුන්වනු ලැබුයේ එබැවිනි. මේ නීතිය යුරෝපයේ වෙනත් රටවල දකින්නට නොතිබූ නීතියක් විය. ඒ නීතිය හේතුවෙන් එංගලන්තයට දෙපැත්තකින් වාසි විය.

© Prof. Nalin De Silva

පළමුවෙන් ම ඉඩම හිමිවූයේ එක් පුතකුට, වැඩිමහල් පුතාට, පමණක් බැවින් ඉඩම්හිමියාගේ අභාවයෙන් පසුව ඉඩම කිහිප දෙනකු අතර බෙදී නො ගියේ ය. අද පවා එංගලන්තයේ වපසරියෙන් ඉතා විශාල ඉඩම් දකින්නට ලැබෙන්නේ එබැවිනි. විශාල ඉඩම් පැවතීම හේතුවෙන් පසු කලෙක යන්ත්‍රෝපකරණ යොදවා කටයුතු කිරීම පහසු විය. එලෙස යන්ත්‍රෝපකරණ යෙදවීමෙන් වැඩි අස්වැන්නක් ලබාගැනීමට ඉඩම් හිමියාට හැකි විය. අනෙක් අතට වැඩිමහල් පුත්‍රයාට හැරෙන්නට අනෙක් පුතුන්ට ඉඩම් නො ලැබුණු බැවින් ඒ අනෙක් අයට වෙනත් කාර්යයක් කිරීමට බලකරනු ලැබිණි. එංගලන්තයේ බොහෝ විට වෙනත් කර්මාන්තශාලා ඇතිකරනු ලැබුයේ එලෙස ඉඩම් හිමි නොවුණු පුතුන් විසිනි.

වැඩිමහල් පුතුන් ඉඩම් හිමි රදළයන් ලෙස වැජඹෙද්දී අනෙක් පුත්තු කර්මාන්තශාලා හිමියෝ වූහ. නගරවලට පැමිණි මේ පුත්තු ටික කලෙකින් ආර්ථික බලයක් ඇතිකරගත්තෝ රජුගේ බලයට ද අභියෝග කළහ. මේ අභියෝග කෙළවර වූයේ පොදු ජනයාගේ සභාව (House of Commons) යන අදහස ඇති පහළ මන්ත්‍රණ සභාව පිහිටුවීමෙනි. ක්‍රමයෙන් පාලන බලය රජුගෙන් මේ සභාවට මාරුවිණි. එහෙත් ඒ සිදුවූයේ සියවස් කිහිපයකින් හා ලේ වැගිරීම් ගණනාවකින් පසුව ය.

ඊනියා පොදු ජනයාගේ සභාව කලක් ගතවන තුරුම කලින් කියන ලද ආකාරයට වැඩිමහල් නොවන පුතුන්ගේ මන්ත්‍රී මණ්ඩලය විය. එයට අමතරව එංගලන්ත පාර්ලිමේන්තුවේ සාමි මන්ත්‍රී මණ්ඩලය (House of Lords) යනුවෙන් තවත් සභාවක් වෙයි. මේ සභාවේ අසුන් ගත්තෝ ඉඩම් හිමි රදළයෝ ය. එකල එංගලන්ත පාර්ලිමේන්තුවේ දක්නට ලැබුණු කරුණක් වූයේ වැඩිමහල් සොහොයුරා සාමි මන්ත්‍රී මණ්ඩලයෙහි අසුන් ගනිද්දී බාල සොහොයුරා පොදු ජනයාගේ සභාවේ අසුන් ගැනීම ය. කෙසේ වෙතත් ප්‍රථමජන්මාධිකාරය එංගලන්තයට මහත් වාසියක් අත්පත් කර දුන්නේ ය.

බ්‍රිතාන්‍යන් සිංහල භික්ෂූන් වහන්සේ හා විහාර අයිතිය සඳහා පැණවූයේ ද ප්‍රථමජන්මාධිකාරය යි. යම් විහාරයක විහාරාධිපති ස්වාමීන් වහන්සේ අපවත් වීමෙන් පසුව ඊළඟ විහාරාධිපතින් වහන්සේ බවට පත්වූයේ අපවත් වූ විහාරාධිපතීන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ ය. මේ නීතිය එංගලන්තයේ ඉඩම් සම්බන්ධයෙන් යහපත් වුවත් ලංකාවේ පන්සල් සම්බන්ධයෙන් ගත්කල පරිහානියට තුඩු දෙන්නක් විය. විහාරය සඟ සතුකර පූජා කෙරෙන්නේ නම් ඒ විහාරයට වෙනම අධිපති භික්ෂූන් වහන්සේ නමක් අවශ්‍යය නො වෙයි. සමස්තයක් ලෙස ගත්කල සිංහල සම්ප්‍රදාය  වූයේ විහාර සාංඝික ව පූජාකිරීම ය. විහාර සම්බන්ධයෙන් තබා ගිහියන් පදිංචි නිවාස හා ඉඩම් සම්බන්ධයෙන්වත් අයිතිය යන සංකල්පය පැරණි සිංහලයන්ට නො වී ය.

විහාරාධිපතීන් පත්කිරීම පිළිබඳ බ්‍රිතානි නීති යටතේ සංඝ සමාජය බෙදෙනු වැළැක්විය නො හැකිවිය. විහාරාධිපති තනතුර පිළිබඳ ප්‍රශ්න ඇති වූ විට ඒ නිරාකරණය කරගැනීමට භික්ෂූන් වහන්සේට ඉංගිරිසි අධිකරණයෙහි පිහිට පැතීමට සිදුවිය. ඉන් සිදු වූයේ භික්ෂුත්වයට නිගා කිරීම ය. භික්ෂූන් වහන්සේට යම්කිසි සහනයක් පතා ගිහි විනිශ්චයකරුවන් යුක්තිය විසඳු අධිකරණය ඉදිරියට යෑමට සිදුවිය. එහි දී භික්ෂූන් වහන්සේ එක්කෝ පැමිණිළිකරු එසේත් නැත්නම් විත්තිකරු ස්වාමීන් වහන්සේ විය. බ්‍රිතානි ගිහි අධිකරණයෙහි  යුක්තිය පසිඳනු ලැබුයේ රෝම ලන්දේසි නිතියට හෙවත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි නීතියකට යටත්ව ය. බොහෝ විට භික්ෂූන් වහන්සේ මේ නීතිය නොදත්සේක. එවිට උන්වහන්සේට ගිහි නීතිඥවරයකුගේ උපදෙස් පැතීමට සිදුවිය. ගිහියා භික්ෂූන් වහන්සේගෙන් උපදෙස් පතනු වෙනුවට භික්ෂූන් වහන්සේට ගිහියාගෙන් උපදෙස් පැතීමට සිදුවිය.

විහාරාධිපති තනතුරට අමතරව බ්‍රිතානිහු වෙනත් නායක පදවි ද ඇතිකළහ. මහානායක පදවිවල සිට සෙසු සියළු නායක පදවි සඳහා අක්තපත්‍ර දෙනු ලැබුයේ ඉංගිළිසි ආණ්ඩුකාරයා විසින් බ්‍රිතානි රජුගේ නාමයෙනි. ඒ නායක පදවි පිරිනැමීමේ දී ආණ්ඩුකාරයා හෝ වෙනත් අයකු හෝ විසින් දෙන ලද අක්තපත්‍රය ඉතාම නින්දාශීලී එකක් විය. ඒ අක්තපත්‍රයට අනුව මහානායක පදවිය ඇතුළු ඕනෑම නායක පදවියකට පත්වන භික්ෂූන් වහන්සේ බ්‍රිතානි රජුට හා ඔහුගේ ආණ්ඩුවට පක්ෂපාති වීමටත් ඊනියා උතුම් වූ ඉංගිරිසි ආණ්ඩුවට විරුද්ධව කටයුතු කරන්නන් පිළිබඳ ව ආණ්ඩුවට ඔත්තු සැපයීමටත් බැඳී සිටියේ ය.

© Prof. Nalin De Silva

ජාතියේ මුරදේවතාවුන් වහන්සේ වූ භික්ෂූන් වහන්සේ බ්‍රිතානි ආණ්ඩුවේ ඔත්තුකරුවකු බවට පත්කිරීමට ඉංගිරිසිහු එසේ සමත්වූහ. ජාතික නිදහස් සටනකට සමස්තයක් ලෙස ගත්කල භික්ෂූන් වහන්සේගේ අවවාද හා අනුශාසනා ලැබීම එතෙකින් අවසන් වූවා පමණක් නොව එවැනි සටනකට සූදානම් වූ ගිහියකුට ඉන්පසු භික්ෂූන් වහන්සේගෙන් පරෙස්සම් වීමට සිදු වූයේ උන්වහන්සේ නායක ස්වාමීන් වහන්සේ ඔස්සේ ආණ්ඩුවට ඔත්තු සැපයිය හැකිය යන අවිශ්වාසය හේතුකොට ගෙන ය. බ්‍රිතානීන්ට මේ සියල්ල කිරීමට අවුරුදු තිහ හතළිහකට වඩා ගත නොවුණි. අවුරුදු දෙදහසකට වැඩි කලක් පැවති ජාතියක කොන්ද කැඩීමට බ්‍රිතානීහු තම සුවිශේෂවූ රාජ්‍ය තන්ත්‍රික උපක්‍රම යොදාගත්හ. ඒ තුවක්කුවේ බලයෙන් පමණක් කළ දෙයක් නො වී ය. මුළු මහත් ලෝකයක් ම අදත් පාලනය කෙරෙන්නේ තුවක්කුවේ බලයෙන් පමණක් නො වෙයි.

බ්‍රිතානීන් විසින් ඇතිකරනු ලැබූ හෝ ඇතිකිරීමට උපදෙස් දෙනු ලැබූ හෝ ඇතැම් නායක පදවිවල ඇත්තේ උපහාසයකි. අද ඒ ඒ නිකායේ ඒ ඒ පළාත්වල අධිකරණ නායක ස්වාමීන් වහන්සේ වෙති. එහෙත් මේ අධිකරණ නායක ස්වාමීන් වහන්සේ ද ප්‍රශ්නයක් ඇති වූ විට පැමිණිලිකරුවකු විත්තිකරුවකු සාක්ෂිකරුවකු ආදී වශයෙන් ගිහි අධිකරණය ඉදිරියට යා යුතු සේක. අධිකරණ නායක ස්වාමීන් වහන්සේ යනුවෙන් පදවියක් ඇතිකිරීමේ තේරුම කුමක් ද? යුද්දෙට නැති කඩුව කොස් කෙටීමට ගත්ත ද අධිකරණ නායක ස්වාමීන් වහන්සේට සමථ මණ්ඩලයක සභාපති කෙනකු ලෙසවත් ක්‍රියාකිරීමට නො හැකි ය.. අධිකරණ නායක පදවිය එවැනි ගිහි කටයුතු සඳහා වූ පදවියක් නොව ශාසනික කටයුතු සඳහා වූවක් යැයි කීමට කිසිවකු ඉදිරිපත් විය හැකි ය. එහෙත් අධිකරණ නායක ස්වාමීන් වහන්සේ එසේ විසඳන ශාසනික ප්‍රශ්න ද එතරම් නැති බව බොහෝ දෙනා දනිති. එයට හේතුව අවසානයේ දී ඉංගිරිසි නීතිය බුද්ධ නීතිය (විනය) ඉක්මවා යන ලෙස ඉංගිරිසින් තම නීති සම්පාදනය කර ඇති බැවිනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva